**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 253 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජුනි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ සිට පවත්වාගෙන යන ලංකා බැංකුව - ටෙලර් යන්ත්‍රය පිහිටි කොටසට විධිමත් පරිදි ගිවිසුම් ගත වී නොතිබුණු අතර කුලී ආදායම් අය කරගෙනද නොතිබුණි. | ගිවිසුම් ගත වීම සහ ගොඩනැඟිලි කුලී අයකරගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතියි. | විධිමත් පරිදි ගිවිසුම් ගත වීමට හා කුලී ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් ආයතන විසින් බැර කරන ලද රු.මිලියන 23,009.29 ක දායක මුදල් පිළිබඳ බැර නිවේදන ගෙන්වා ගැනීමට හා වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 166.99 ක හර කිරීම්වලින් රු.මිලියන 166.79 ක හර කිරීම් තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන වලින් හර නිවේදන ඉල්ලා යවා ඇති අතර මේ වන විටත් හර නිවේදන ලැබෙමින් පවතී. ගිණුමට අදාලව හරස් සටහන් මගින් සිදු කරන බැර කිරීම් සම්බන්ධව එක් එක් ආයතන පසු විපරම් කර බැලීම අප දෙපාර්තමේන්තුවට ප්‍රායෝගිකව අපහසු කටයුත්තක් වේ. එසේම පැවති ව්‍යාකූල ආණ්ඩුකරන තත්ත්වයන් හේතුවෙන් එක් එක් ශීර්ෂයන්ට අදාල ආයතන එකතුවීම්, අහෝසිවීම් ආදී හේතුන්ද මෙම විචල්‍යතාවයන් කෙරෙහි බලපානු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාජ සංරක්ෂණ දායක මුදල් පළාත් සභා සහ මධ්‍යම රජයේ ආදායම් ගිණුම් යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණු බැවින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල ඒ ඒ පුද්ගලයාගෙන් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න දෙපාර්තමේන්තුවට සනාථ කරගැනීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි. | මෙම ගැටළුවට විසඳුමක් ලෙස මේ වන විට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කර ඇත. දායක මුදල් ආපසු ගෙවීම් යනාදී ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව, අඛන්ඩව ලැබුනේද යන්න තහවුරු කර ගත හැකි වේ. | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන දායක මුදල් නිශ්චිතව ලැබුණේ දැයි තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියලුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙන්වා ගත යුතු වුවද පළාත් සභා 5 ක දින 5 සිට දින 69 දක්වා කාල ප්‍රමාදයක් සහිතව චෙක්පත් ලැබී තිබුණි. | බලපවත්වන මාසයක දායක මුදල් වෙන් කිරීම සිදු කරනු ලබන්නේ වැටුප් ගෙවන අවස්ථාවේදී බැවින් ඊළඟ මාසයේ 15 දින වන විට එම මුදල් ගෙන්වා ගැනීම ප්‍රායෝගිකව සිදු කල නොහැකි නිසා එම මාසයේ 20 වන දින දක්වා කල් ලබාදීමක් සිදු කර ඇති අතර ප්‍රමාද වන සෑම අවස්ථාවකම දුරකථන මාර්ගයෙන් සහ ලිපි මඟින් අදාල මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | චෙක්පත් මඟින් දායක මුදල් එවනු ලබන ආයතන 19 ක් ඉදිරිපත් කරන ලද රු.මිලියන 23.75ක් වටිනා චෙක්පත් 26 ක් විවිධ හේතුමත 2022 ජනවාරි 12 දින සිට 2022 දෙසැම්බර් 27 දක්වා ආපසු හරවා යවා තිබු නමුත් 2023 අප්‍රේල් 01 වන විට මාස 06 කට අධික කාලයක් ගත වී ඇතත් එම දායක මුදල් නැවත අයකරගෙන නොතිබූ අතර එය වර්ෂය අවසානයේ හිඟ ආදායම ලෙසද ඇතුළත් කර නොතිබුණි. | නැවත හරවා යවනු ලබන චෙක්පත් අප වෙත ලැබුණේ ද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි වීමෙන් හා ආපසු හරවා යවනු ලබන ඇතැම් චෙක්පත් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අයත් නොවන අවස්ථා ද ඇති බැවින්, එම චෙක්පත් වල වටිනාකම හිඟ ආදායමක් ලෙස ගණනය කර ගත නොහැකි වේ. | හිඟ ආදායම් නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ඊ) | චෙක්පත් ආපසු යැවීමේ ලේඛනය අනුව ආපසු යවන ලද චෙක්පත් වෙනුවට වෙනත් චෙක්පතක් එවන අවස්ථාවලදී එම නැවත එවන චෙක්පතේ අගය මුල් චෙක්පතේ අගයට වඩා වැඩි අගයක් ගත් අවස්ථා 02ක්ද, අඩු අගයක් ගත් අවස්ථා 01ක්ද විය. | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා මාසිකව චෙක්පත් 900 ක් පමණ ලැබේ. එසේ හරවා යවනු ලබන චෙක්පත් අප වෙත ලැබීමට සැලකිය යුතු කාලයක් ගත වන නිසාත්, එම හරවා යැවූ චෙක්පත් ම අප වෙත ලැබුණේ ද යන්න නිශ්චිතව හඳුනාගැනීම ප්‍රායෝගිකව කළ නොහැක. | ආපසු යැවූ චෙක්පත් සඳහා මුදල් ලැබුනේ ද යන්න තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 ගණකාධිකාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳව හා අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාලෝචනයන් සිදුකර කලින් කලට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි අත්‍යවශ්‍ය වෙනස්වීම් සිදුකර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | • 9 වන වගන්තිය | - | උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයකට යොමු කළ යුතු වුවත් පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිසිදු ආබාධිත ගොනුවක් සම්බන්ධයෙන්ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරියේදී වෛද්‍ය මණ්ඩල වෙත යොමු කර වෛද්‍ය වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | - | ග්‍රාම නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් විෂයය සම්බන්ධ වගකීම් පැවරීම යටතේ ග්‍රාම සේවා නිලධාරීන් විසින් පවත්වාගෙන යනු ලබන විශ්‍රාමිකයින් පිළිබඳ මූලික ලේඛනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේඛනය සමඟ සසඳා යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2010 සැප්තැම්බර් 07 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 8/2010 හා 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | 22,992,945 | රාජ්‍ය සේවකයකු ලබන රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත් නාරම්මල, පඩුවස්නුවර(බටහිර), බියගම, දොම්පේ,තිඹිරිගස්යාය, රිදීගම, ගම්පහ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එම දීමනාව ඉක්මවා විශ්‍රාමියන් 44 දෙනෙකු හා මියගිය නාවික හමුදා රණවිරුවන් 82 දෙනෙකු වශයෙන් 129 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම හා අඩුවෙන් ගෙවීම් සම්බන්ධයෙන් වැඩිදුරටත් පරීක්ෂා කර පිළිතුරු ලබා දීමට සටහන් කරගතිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | එසේම, ජීවන වියදම දීමනාව රු.7,800 දක්වා ලබා ගත හැකි වුවද විශ්‍රාමිකයින් 43 දෙනෙකු සඳහා රු.7,120,689 ක් ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි. | | |
| (ඇ) | 2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 දරන හා 2013 සැප්තැම්බර් 20 දිනැති අංක 03/2013 විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | 1,892,716 | යළි විවාහ වන වැන්දඹුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් සියයට 50 ක් හිමි වුවද නැවත විවාහයෙන් පසුවද සම්පූර්ණ වැටුප ගෙවා තිබීම නිසා දොම්පේ, ගම්පහ හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 4 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ගෙන් පිළිතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2014 පෙබරවාරි 20 දිනැති අංක 2/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 557,607 | ත්‍රස්තවාදී හේතුවෙන් මියගිය හා අතුරුදහන් වූ පොලිස් නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත යැපීම් දීමනා ගෙවීම් ආරම්භ කරන විට වන්දි විශ්‍රාම වැටුප ගෙවමින් පවතින්නේනම් වන්දි විශ්‍රාම වැටුප නතර කල යුතු අතර අදාල වන්දි විශ්‍රාම වැටුපේ වැඩිපුර ගෙවූ වැටුප සමඟ අන්තර් දීමනාව හා ජීවන වියදම් දීමනාව, යැපීම් දීමනාවේ හිඟ මුදලින් අයකර ගත යුතු වුවත් රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවන ලද රු. 557,607 න් රු.175,570 ක් හිඟ මුදල් ගෙවීමේ දී අය කර ඇත. ඉතිරි රු.401,792 ක මුදල 2023 ජූලි මස සිට අය කිරීම සඳහා යොමු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 2014 ඔක්තෝබර් 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 4 හි (iv) වන ඡේදය | - | ප්‍රථම මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර උපරිම වශයෙන් මාස 03 ක් ගත වන විට දී විශ්‍රාම වැටුප් ලිපිගොනුව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වා ගත යුතු වුවද පාතදුම්බර, කුණ්ඩසාලේ, කැලණිය, නාරම්මල, බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල ගොනු 27 ක් ප්‍රථම විශ්‍රාම වැටුප ගෙවීම් කර මාස 4 සිට අවුරුදු 02 ක් අතර කාලයක් ගත වී ඇතත් එසේ ගොනු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් 16 දෙනාගෙන් 13 දෙනකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු මේ වන විට ගෙන්වාගෙන ඇති අතර ඉතිරි විශ්‍රාම වැටුප් 03 ගෙවීම තාවකාලිකව නවතා ඇත. අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ගෙන් පිළිතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 150,500 | මාසිකව ගෙවනු ලැබූ අයවැය දීමනාව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විශ්‍රාම වැටුප් අංක 40 – 3011 යටතේ අන්තර් දීමනාව රු.4750 ක් ද 4–21321 යටතේ රු.1750 ක් ද ගෙවා තිබීමෙන් 2014 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා දීමනා වැඩිපුර ගෙවා තිබුණි. | විශ්‍රාම වැටුප් අංක 40-3011 සහ 04-21321 වෙත දීමනා සංශෝධනය කිරීමේ දී වැඩිපුර ගෙවීමක් සිදු වී ඇති අතර කඩිනමින් එය අය කර ගැනිමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (උ) | 2016 අප්‍රේල් 27 දිනැති අංක 03/2016 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | | | |
| | (i) 3 වන ඡේදය | - | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගත් විශ්‍රාමිකයින් 14 දෙනෙකුට විශ්‍රාම වැටුප් විෂමතාව සකස් කිරීමෙන් තොරව අන්තර් දීමනාව ගෙවා තිබුණි. | විශ්‍රාම වැටුප් ලිපිගොනු පරීක්ෂා කර ඉදිරියේදී විෂමතාවය සකස් කිරිමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 7 වන ඡේදය | 764,719 | 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා විශ්‍රාමිකයින්ට අන්තර් දීමනා හිමි නොවිය යුතු වුවත් වත්තල, පාතදුම්බර, කුණ්ඩසාලේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අදාලව විශ්‍රාමිකයන් 64 දෙනෙකුට අන්තර් දීමනාව ගෙවා තිබුණි. | පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශ්‍රාමිකයන් හත් දෙනෙකු සඳහා අවු 55 දක්වා වැටුප් ගෙවන බැවින් විෂමතාවය හිමි නොවන බවත් තිදෙනෙකුගේ විෂමතාවය සකස් කිරීමට කටයුතු කරන බව.<br>කුණ්ඩසාලේ හා වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල දායකයන් 2016 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගිය අය වේ.<br>හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විෂමතාවය සකස් කළද නොගෙවීමට හේතු පරික්ෂා කිරිමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (එ) | 2017 අප්‍රේල් 07 වන දිනැති අංක 01/2011 (සංශෝධන) 1 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | - | විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාසික විශ්‍රාම වැටුප් වියදම විශ්‍රාමිකයන් සංඛ්‍යාවේ සිදුවන එකතු කිරීම් අඩු කිරීම් සංශෝධන ඇතුළත් වාර්තාවක් මාසිකව සකස් කර දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ පාලන ගිණුම සමඟ සංසන්ද නය කළ හැකි ක්‍රම වේදයකට පාලන ගිණුමක් සකස් කළ යුතු වුවත් රිදීගම, කුලියාපිටිය(නැගෙනහිර), කැලණිය, නාරම් මල, බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල එසේ සිදුකර නොතිබුණි. | සියළුම විශ්‍රාම වැටුප් ගෙවීම් හා සංශෝධන ක්‍රියාවලිය මධ්‍යගත දත්ත පද්ධතියෙන් සිදු කරන බැවින්, දැනට පවතින එම ගෙවීම් ක්‍රියාවලියට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වෙනම පාලන ගිණුමක් පවත්වා ගෙන යාමට යම් අපහසුතාවයක් පැවතියත් විශ්‍රාම වැටුප් 01/2011 ප්‍රකාරව මැයි මස සිට පාලන ගිණුම පවත්වාගෙන යන බව ප්‍රාදේශීය ලේකම් විසින් දක්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2018 ජූනි 20 දිනැති හා අංක 01/2018 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ | | | | |
| | (i) 5 (iii) ඡේදය | - | වසර දෙකකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත වන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුපප විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් ලබාගත යුතු බව දක්වා තිබුණත් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් 05 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු එසේ විදේශ විශ්‍රාම වැටුප් අංශයට මාරුකර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් විසින් මේවන තෙක් පිළිතුරු ලබා දී නොමැති බැවින් පිළිතුරු ලබා දුන් පසු ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 7(ii) හා 9 ඡේද | - | විදේශ විශ්‍රාම වැටුප් අංශය විසින් තානාපති කාර්යාල මඟින් සහතික කරන ලද ජීවිත සහතික ඉදිරිපත් කළයුතු වුවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය | ඉදිරියේදී නියමිත පරිදි අත්සන් සහිතව පදිංචිය සහතික කිරීමේ පත්‍ර භාර ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු ග්‍රාම නිලධාරී විසින් අත්සන් කල ජීවිත සහතික ඉදිරිපත් කිරීම මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කර තිබුණි. | කර ඇත. කෙසේ වෙතත් මේ වන විට ඇඟිලි සලකුණු මඟින් ජීවත්වීම සහතික කර ගැනීමේ ක්‍රමයක් ආරම්භ කර ඇති බැවින් එවැනි අතපසුවීම් අවම කර ගැනීමට හැකිවේ. | |
| (ඔ) | 2018 ජුලි 17 දිනැති අංක 9/2008 (සංශෝධන ii) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | - | සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප (59) හා දුබලතා විශ්‍රාම වැටුප (6) ඒකාබද්ධ කර ගෙවීම් සිදුකළ යුතු වුවත් කැලණිය, නාරම්මල,මහරගම,පඬුව ස්නුවර (බටහිර) , බියගම, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශ්‍රාමිකයින් 35 දෙනෙකු හා දත්ත පද්ධතිය තුළින් හඳුනාගත් විශ්‍රාමිකයින් 03 දෙනෙකු වශයෙන් විශ්‍රාමිකයින් 38ක් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. | කාණ්ඩ ඒකාබද්ධ කිරීම සඳහා කටයුතු කරන බව සඳහන් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඕ) | 2019 මැයි 30 දිනැති අංක 2/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති රෙගුලාසි අත්පොතේ නියෝග ප්‍රකාරව ආණ්ඩුවේ විශ්‍රාම වැටුපක් ලබමින් සිටි පුද්ගලයකුගේ මරණයක් ලියාපදිංචි කළ විට ඒ බව බී 73 පෝරමයේ ලියා දිස්ත්‍රික් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත වාර්තා කළ යුතු බවත් එහි පිටපතක් තමන් වෙත සතියකට වරක් එවන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා විසින් තම පාලන කටයුතු කරන | විගණනය විසින් දැනුම් දීමෙන් පසුව මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් හා ග්‍රාම නිලධාරීන් දැනුවත් කළ බව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සඳහන් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රෙජිස්ටාර්වරුන්ට දැන්විය යුතු වුවත් පඩුවස්නුවර (නැගෙනහිර), කුලියාපිටිය(නැගෙනහිර), දෙහිවල, මහරගම, හෝමාගම ප්‍රාදේශීය ලේකම්වරු විසින් එසේ දන්වා නොතිබුණි. | | |
| (ක) | 2019 ජුනි 11 දිනැති අංක 1/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | - | චක්‍රලේඛ ප්‍රකාරව විශ්‍රාම වැටුප් ගැලපීම 2019 ජුලි 01 දින සිට කළයුතු වුවත්, කැලණිය, ගම්පහ, පඩුවස්නුවර (නැගෙනහිර), පඩුවස්නුවර (බටහිර), රිදීගම, නාත්තණ්ඩිය, පාතදුම්බර, නාරම්මල, හාරිස්පත්තුව, වත්තල, කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියැදි පරීක්ෂාවේදී විශ්‍රාමිකයන් 255 කගේ අදාල සංශෝධනයන් සිදු වී නොතිබුණි. | සංශෝධනය කළ හැකි සියළුම විශ්‍රාම වැටුප් මේ වන විට සංශෝධනය කර ඇති බවත් ලිපිගොනු තුළ පවතින අඩුපාඩු සඳහා විශ්‍රාමිකයන් සතුව පවතින ලේඛන ගෙන්වා ගැනීමෙන් හා විවිධ ආයතන වලින් ගෙන්වා ගත යුතු ලේඛන ගෙන්වා ගෙන ලිපිගොනු සම්පූර්ණ කර සංශෝධනයන් සිදු කරන බව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සඳහන් කර ඇත. දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති විෂමතාවයන් ද පරීක්ෂා කිරීමෙන් පසු සකස් කළ යුතු වේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ග) | 2022 ජනවාරි 20 දිනැති අංක 01/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | | | |
| | (i) 2(i) ඡේදය | 1,440,675 | කිසියම් තැනැත්තෙකු විශ්‍රාම වැටුප් කිහිපයක් ලබන විට එවැනි තැනැත්තෙකුට හිමි වනුයේ මසකට එක් විශේෂ දීමනාවක් පමණක් වුවද විශ්‍රාම වැටුප් වර්ග කිහිපයක් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි වැඩිපුර ගෙවමින් පැවති විශේෂ දිමනාව මේ වන විට නවතා ඇති අතර ඉදිරියේදී අය කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සඳහා වෙන් වෙන් වශයෙන් විශේෂ දීමනා වැඩිපුර ගෙවීම් සිදුකළ අවස්ථා 30 ක් රිදීගම, බියගම, දොම්පේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා දත්ත පද්ධතිය තුළින් නිරීක්ෂණය විය. | | |
| | (ii) 2(iii) ඡේදය | 445,000 | ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය හෝ දුබලතාවයට පත්ව වයස අවුරුදු 55 දක්වා සේවා වැටුප ලබන්නන්ට හෝ ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරින් වෙනුවෙන් ඔවුන්ගේ අවුරුදු 55 දක්වා වැටුප් හිමි යැපෙන්නන්ටද විශ්‍රාම වැටුප සමඟ රු.5,000 දීමනාව හිමි නොවන බව දක්වා තිබුණද විශ්‍රාමිකයින් 10 දෙනෙකු සඳහා එම දීමනාව ගෙවීම් කර තිබූ බව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා දත්ත පද්ධතිය තුළින් නිරීක්ෂණය විය. | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් පිළිතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ජ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (xvi) හා 5 ඡේද | 902,725 | අනවශ්‍ය වියදම් ලෙස සැලකිය හැකි සියලුම වියදම්,රාජ්‍ය ආයතන විසින් පවත්වන උත්සව, විවෘත කිරීම්, සම්මන්ත්‍රණ ඇතුළු අනවශ්‍ය හා ප්‍රමුඛතා නොවන වියදම් අත්හිටුවීම හා ඒවා සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොකිරීම කළ යුතු වුවද 2022 ජාතික විශ්‍රාමික දිනය වෙනුවෙන් වියදම් දරා තිබුණි. | ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව විශ්‍රාමිකයන්ට අදාළ සත්කාර පියසේ කාර්යයන් දිස්ත්‍රික් පහකට විමධ්‍යගත කිරීම වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා මෙම මුදල් වියදම් කරන ලද බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ට) | 2022 ජුනි 22 දිනැති අංක 14/2022, 14/2022(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2022 සැප්තැම්බර් 20 දිනැති අංක 06/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 4,491,427 | විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් විධිමත් පරිදි ලියාපදිංචි නොවීම නිසා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවනු ලැබුවද නිලධාරියා හඳුනාගත නොහැකි බැවින් දායක මුදල් මාසිකව (2022 නොවැම්බර් සිට 2023 පෙබරවාරි දක්වා) හඳුනා නොගත් ලැබීම් ලෙස පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. | තාවකාලිකව පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර ඇති අතර හඳුනාගැනීමෙන් පසු ගිණුම් ගත කිරීම කරනු ලබයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාමික දිනය වෙනුවෙන් ලැබුණු වර්ෂ 02 ක් ඉක්මවූ රු.4,413,050 ක තැන්පත් මුදල් රෙගුලාසි 571(3) පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය. | 2020, 2021 වර්ෂ වල රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සියළු රාජ්‍ය උත්සව අවලංගු කරන ලදි. එම නිසා ජාතික විශ්‍රාමික දිනය සඳහා සංවිධානය කළ සියළු උත්සව අවලංගු කරන ලදි. 2022 වර්ෂයේ පැවැත්වූ ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව විශ්‍රාමිකයන්ට අදාලව සත්කාර පියසේ කාර්යයන් විමධ්‍යගත කිරීම වෙනුවෙන් සංවිධානය කරන ලද උත්සවය සඳහා රු.497,000 ක මුදලක් මෙම තැන්පතුවෙන් ප්‍රයෝජනයට ගන්නා ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනානොගත් ලැබීම් වටිනාකම රු.33,518,799 ක්වූ චෙක්පත් 243 ක් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි | හඳුනා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී. | හඳුනානොගත් ලැබීම් කඩිනමින් හඳුනා ගෙන නිරවුල් කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041643 දරන ලංකා බැංකු ගිණුම හා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041644 දරන ලංකා බැංකු ගිණුම්හි ගනුදෙනු සිදුනොවන බැවින් ඒවා අක්‍රීය බැංකු ගිණුම් ලෙස පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2006 අනුව අයවැය යෝජනා අංක 425 හා 426 මඟින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කර පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස, මහා භාණ්ඩාගාරය විසින් පත් කරනු ලැබූ විශේෂ කමිටුවකින් මෙම අරමුදලට අදාළ පනත් සංශෝධනය කර වසා දැමිය යුතු බවට යෝජනා කළද එම කමිටුවේ අවසන් තීරණය මෙතෙක් ලැබී නොමැත. | අක්‍රිය ගිණුම් වසා දැමිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 25 දිනැති මුදල් චක්‍රලේඛ අංක 2/2020 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් විය යුතු වර්ෂයට අදාල යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම, සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේදී එම වාර්තා ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි මානව සම්පත් කලමනාකරණය, පද්ධති සංවර්ධනය, දෘඩාංග පහසුකම් සංවර්ධනය, ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම යන කාර්යයන්වල කාර්ය සාධනය මැනීමේ දර්ශකය (KPI) හා නිමවුම් (Output) පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී පද්ධති සංවර්ධන කටයුතු ඉදිරියට කරගෙන යාමට කටයුතු කරනු ලැබේ.<br>දෘඩාංග පහසුකම් සංවර්ධනය සහ ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම<br>යටතේ මිළදී ගත් භාණ්ඩ සඳහා වැයවූ මුදල් ප්‍රමාණයන් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ හා සංවර්ධනය සඳහා රු.500,000ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම කාර්යන් ඉටුකර නොතිබූ බැවින් පවතින දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමේ කාර්යභාර්යද ඉටු වී නොතිබුණි | ප්‍රමුඛ නොවන ව්‍යාපෘති සහ වියදම් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන අවුරා තබන ලෙස දන්වා තිබූ බැවින් සැලසුම් කර තිබූ පරිදි පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සිදු කිරීම අත්හිටුවන ලදි. | ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දත්ත සහ තොරතුරු තාක්ෂණ පද්ධති ආරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා CERT ආයතනය සමඟ 2022 මැයි 17 දින සිට වර්ෂයක කාලසීමාවක් සඳහා ගිවිසුම අත්සන් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ගිවිසුම ක්‍රියාත්මක වීම ආරම්භ වීමේදී මුළු පිරිවැයෙන් සියයට 50 ක අත්තිකාරමක් ගෙවිය යුතු වුවත් ගිවිසුම ක්‍රියාත්මක වීම 2022 මැයි 17 දින ආරම්භ වුවද, 2022 මාර්තු 31 දින මුළු පිරිවැය රු.1,660,550 ක් ගෙවීම් කර තිබුණි. | පළමු කාර්තුව සඳහා මෙම වැය විෂයය යටතේ රු. මිලියන 3.7 ක් වෙන් කර තිබූ අතර මාර්තු 31 දිනට ඉතිරිව තිබූ ප්‍රතිපාදන කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගනිමින් මෙම ඉන්වොයිසිය සඳහා චෙක්පතක් ලියා ඇතත් එම චෙක්පත අදාල ආයතනය වෙත නිකුත් ඇත්තේ නියමිත කාර්යය සම්පූර්ණ වූ පසුවය. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රුපියල් මිලියන 785 ක් විය. මෙම වටිනාකම, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රුපියල් 301,522 කින්ද, වර්ෂ 05 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රුපියල් මිලියන 47 කින්ද හා වර්ෂ 05 ට අඩු කාලයකට අයත් රුපියල් මිලියන 738 කින්ද සමන්විත විය. | 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකර ගත යුතු මුදල රු.මිලියන 785 කි. එම මුදල් මේ වන විට අය වෙමින් පවතී. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | හානි හා පාඩු පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් එවන ලද වාර්තාවල සමාලෝචිත වර්ෂයේ අවසන් ශේෂය සමඟ දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂයන් නොසැසඳුනි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් එවන ලද හානි පාඩු පිළිබඳ අවසාන වාර්තාව හා දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වර්ෂ අවසාන හානි පාඩු ලේඛනය අනුව සැසඳීමක් සිදුනොවූ අතර, ඒ සඳහා විවිධ හේතූන් බලපාන ලදි. | දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාල වල වර්ෂය අවසාන ශේෂයන් එකිනෙකට සැසඳීම් කල යුතුය. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද විගණන විමසුම් 43 කින් විගණන විමසුම් 21 කට 2023 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා යොමු කරන විගණන විමසුම් සඳහා එම කාර්යාල විසින් එවන පිළිතුරු අඩුපාඩු සහිත බැවින් ඒවා පරික්ෂා කර නැවත නැවත එම කාර්යාල දැනුවත් කරවා එම අඩුපාඩු සකස් කර නැවත පිළිතුරු ලබා ගනිමින් අවසාන පිළිතුර සකස් කළ යුතු බැවින් ඒ සඳහා කාල ප්‍රමාදයක් සිදු වේ. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීමේදී ආබාධිත තැනැත්තන් වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර ආබාධිතභාවය තහවුරු කෙරෙන වෛද්‍ය වාර්තාවක් ලබාගත යුතු වුවත් එවැනි විධිමත් තහවුරු කිරීමකින් තොරව ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවූ අවස්ථා 08 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කින් නිරීක්ෂණය විය. | විශ්‍රාමිකයන් නැවත වෛද්‍ය මණ්ඩල වෙත හැකි ඉක්මනින් යොමු කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත.<br>කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -2018 ජූලි මස සිට විශ්‍රාම වැටුප ගෙවීම නවතා ඇත.<br><br>පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-<br>වෛද්‍ය මණ්ඩල වාර්තාව සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් අනුමත කළ පසු ආබාධිත විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර ඇත. | ආබාධිත තත්ත්වය තහවුරු කෙරෙන විධිමත් වෛද්‍ය වාර්තාවක් ලබා ගත යුතුය. |
| (ආ) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව මධ්‍යම දත්ත පද්ධතියෙහි, ලිපි ගොනු 09 ක් විදේශ ලිපිගොනු වශයෙන් හඳුන්වා තිබුණද ("Foreign Trf), විශ්‍රාමිකයන් විදේශගත වන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දී නොතිබුණු අතර ජීවිත සහතිකද ලබා දී නොතිබුණි. ග්‍රාම නිලධාරින් විසින්ද ජීවිත සහතික ඉදිරිපත් නොකර විදේශගත වූ එම විශ්‍රාමිකයන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමට ද කටයුතු කර නොතිබියදී විශ්‍රාම වැටුප නැවැත්වීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | විදේශ ගත වීම් නිවැරදිව දැනුම් දිය යුතු අතර වාර්ෂිකව ජීවිත සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 පෙබරවාරි 07 දිනැති හා අංක KDS/KUN/KUN/02/08 දරන ලිපියෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවන ලද විශ්‍රාම වැටුප් අංක 1-725735 දරන විශ්‍රාමික ගොනුව 2020 දෙසැම්බර් 13 වන විගණන දිනය වන විටත් කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී නොතිබුණි. | එම ලිපි ගොනුව සම්බන්ධයෙන් තොරතුරු පරික්ෂා කර ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කරමි. | නොපමාව ලිපිගොනු හුවමාරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අනත්දරුවාගේ වයස අවුරුදු 21 සම්පූර්ණ වීමේ දී අනත් 5/1, අනත් 6, අනත් 8 යන ආකෘති පත්‍ර සම්පූර්ණ කල යුතු වුවද ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකු වෙත එසේ කටයුතු නොකර විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. | මෙ සම්බන්ධයෙන් ගම්පහ ප්‍රාදේශීය ලේකම් විසින් පිළිතුරු සපයා නොමැත. | විධිමත් පරිදි ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | විවිධ හේතු මත දීමනා/විශ්‍රාම වැටුප් සංශෝධනය හෝ නතර විය යුතු වුවත් එසේ කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් ගෙවා තිබූ අවස්ථා 10 ක් නිරීක්ෂණය වූ අතර ඉන් අවස්ථා 05 කදි රු. 489,055 ක් වැඩියෙන් ගෙවීම්කර තිබුණි. | ගම්පහ,කැලණිය හා රීදිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිතුරු සපයා නොමැත.<br>කුලියාපිටිය(නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පරික්ෂා කිරීමෙන් ගෙවීමට කටයුතු කරනු ලැබේ.<br>හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තනතුරෙන් ඉල්ලා අස් වී ඇති බව දැක්වෙන වාර්තාවක් ගොනුවේ අමුණා තිබූ බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කිරීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | ආබාධිත විශ්‍රාම වැටුපට හිමිකම් නොමැති පුද්ගලයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ අවස්ථා 3 ක් පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිරීක්ෂණය විය. | ආබාධිත විශ්‍රාම වැටුප සඳහා ඉල්ලීම් කර ඇත්තේ දායකයා හෝ කලත්‍රයා මිය ගිය පසුව වුවද සියළු ආබාධිත තත්ත්වයන් සිදු වී තිබෙනුයේ අනත්දරු වයස සම්පූර්ණ කිරීමට පෙර බව වෛද්‍ය මණ්ඩල වාර්තා මඟින් තහවුරු කරගෙන ගෙවීම් සිදු කරන බවට ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. | වෛද්‍ය මණ්ඩල වාර්තාව මඟින් ආබාධිත බව නිශ්චිතව තහවුරු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-1251535, 21-202514 අංක දරන විශ්‍රාමිකයාගේ වැන්දඹු විශ්‍රාම වැටුප 1984 නොවැම්බර් 05 සිට ගෙවීම ආරම්භ කර තිබූ අතර එසේ විශ්‍රාම ලබාගැනීමේ දී වැන්දඹුව විසින් තම පෙර විවාහය පිළිබඳ තොරතුරු වසන්කර දෙවන විවාහ සහතිකයට ද අවිවාහක ලෙස සටහන් කර විශ්‍රාම වැටුප ලබා ගෙන ඇති බව නිරීක්ෂණය විය. තවද, පළමු විවාහයේ ස්වාමි පුරුෂයා පිළිබඳ තොරතුරු වැන්දඹු හා සිවිල් ලිපිගොනු දෙකෙහිම ඇතුලත් නොවූ අතර පළමු විවාහයේ දරුවාගේ උප්පැන්න සහතිකයෙහි පළමු ස්වාමි පුරුෂයාගේ නම සඳහන් වුවත් එම විවාහය අවසන් වීම පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනීමට නොහැකි විය. ඒ අනුව පළමු විවාහය අවසන් වීම තහවුරු කර ගැනීමෙන් තොරව වැන්දඹු විශ්‍රාම වැටුප ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කරමි. | විධිමත් පරිදි තහවුරු කර ගැනීමෙන් පසු විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. |
| (ඌ) | පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 01-1107670 දරන විශ්‍රාමිකයා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියෙහි 2019 ඔක්තොම්බර් 19 දිනැති තීරණය පරිදි 2013 ජනවාරි 11 දින සිට සේවයෙන් පහකර ඇති අතර 2013 ජනවාරි 11 දින සිට 2013 මැයි 16 දින දක්වා ගෙවා ඇති වැටුප රු.136,155 ක් අයකර ගන්නා ලෙස නිතිපතී දෙපාර්තමේන්තුව විසින් 2019 නොවැම්බර් 16 දින දැනුම් දී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, සේවයෙන් පහ කල නිලධාරියෙකුට විශ්‍රාම වැටුප සඳහා හිමිකමක් නොමැති වුවත් ගෙවන ලද විශ්‍රාම වැටුප රු.560,339 හා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය රු.187,434 ක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් අංක 1-1107670 විශ්‍රාමිකයා වෙත ගෙවන ලද වැටුප වන රු. 136,154.83 ක මුදල කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2021.08.13 දින අය කර ඇති බවත් ගෙවන ලද විශ්‍රාම වැටුප සහ පාරිතෝෂික මුදල වන රු.675,604.67 අය කර ගැනිම සඳහා විශ්‍රාමිකයා වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත් ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. | හිමිකම් නොමැති විශ්‍රාම වැටුප් ගෙවීම කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සෑම විශ්‍රාමිකයකු සඳහා ම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යා යුතු වුවද කැළණිය ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 07 දෙනෙකු වෙතද නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් | • කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>තාවකාලික ලිපිගොනු සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | විශ්‍රාම වැටුප් ගොනු නොමැතිව ගෙවීම් නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලයේ විශ්‍රාමිකයකු වෙතද විශ්‍රාම වැටුප් ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවන බව නිරීක්ෂණය විය. | • නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>මේ පිළිබඳව පරීක්ෂා කර පිළිතුරු ඉදිරිපත් කරමි | |
| (ඒ) | වයස 18 සම්පූර්ණ වී තිබුණු බැවින් අදාල බැංකු පාස් පොත බාල වයස්කරුවාට භාරදිය යුතු වුවත් නාරම්මල හා බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බාල වයස්කරුවන් 05 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | • නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වයස සම්පූර්ණ වූ දරුවාගේ පාස්පොත ඇය වෙත භාර දී ඇත.<br>• බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දරුවන් ගැන කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකි වී ඇති බවත් තවදුරටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බවත් ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. | වයස 18 සම්පූර්ණ වූ පුද්ගලයන්ගේ පාස් පොත් කඩිනමින් භාර දීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-204986 දරන විශ්‍රාමිකයා සේවයෙන් පහකර තිබුණු අතර විශ්‍රාම වැටුප් සකස් කිරිමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8.2 හි (I) හා (II) අනුව චර්යා සටහනෙහි පිටපතක් හා මු.රෙ 1729 වාර්තාව විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා විශ්‍රාම 2020 අත්පොතෙහි 4.5.3 ඡේදය ප්‍රකාරව 1981 ජූලි 02 දිනට පෙර සේවය හැර යන නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු සොයා ගත නොහැකි විට රුපියල එක පදනමට ගණනය කරන ලද විශ්‍රාම වැටුපක් ගණනය කළ යුතු වුවත් ඊට පටහැනිව විශ්‍රාම වැටුප ගණනය කර තිබුණි. | සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙතින් එම විශ්‍රාමික මහතාගේ චර්යා සටහන් පිටපත් එවන ලෙස දන්වා යැවුවද එම පිටපත් එවා නොමැති අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 121 අනුව තොරතුරු හා දායක මුදල් අය වූ බවට වාර්තාවක් ලබා දී ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත.පරීක්ෂා කර නිවැරදි කළ යුතු වන්නේ නම් එය නිවැරදි කර ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අදාල ලියවිලි ලබා ගැනීමට ආයතන දැනුවත් කළ යුතුය. |
| (ඕ) | හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, විශ්‍රාම වැටුප් අංක 21-300870 දරන විශ්‍රාමිකයාගේ චර්යා සටහන් පත්‍රය අනුව ආකෘති පත්‍ර 12 හි විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී දෛනික වැටුප් මත හා විශ්‍රාම වැටුප් අහිමි කාලය | විගණනය සිදු වන අවස්ථාවේ ලිපි ගොනුවේ විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය අමුණා තිබූ බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත.<br>එම විශ්‍රාම වැටුපට අදාල | සේවා කාලය පදනම් කරගෙන විශ්‍රාම වැටුප ගෙවිය යුතුය |

| | | | |
|---|---|---|---|
| | යන පදනම් අනුව සේවය කරන ලද කාලය සැලකීමෙන් තොරව සම්පූර්ණ සේවා කාලයම විශ්‍රාම වැටුප් සහිත පදනම මත සේවය කල සේ සලකා තිබුණි.තවද විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක්ද ලිපිගොනුවෙහි නොතිබුණු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හා 14/2019 විශ්‍රාම වැටුප් සංශෝධන සඳහා පදනම් කර ගන්නා ලද වැටුප නිවැරදිද යන්න තහවුරු නොවුණි. | ගණනය කිරීම් විශ්‍රාම වැටුප් ලිපිගොනුවේ ඇතුළත් කර තිබූ බවද සඳහන් කර ඇත | |
| (ක) | 2014 ජනවාරි 10 දිනැති 1/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සේවකයකු ලබන රු.7,800 දක්වා ජීවන වියදම් දීමනාවක් ලබාගත හැකි වුවත් එකම කරුණක් මූලික කරගෙන පැන නැගුණු විශ්‍රාම වැටුප හා යැපීම් දීමනාව වෙනුවෙන් විශ්‍රාම වැටුපට මෙන්ම යැපීම් දීමනාවට තවත් දීමනාවක් ලෙස ජීවන වියදම් දීමනාව අවස්ථා දෙකේම ගෙවන බැවින් එය මතභේදයට තුඩු දෙන ගෙවීමක් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. ඒ අනුව විශ්‍රාම වැටුප හා යැපීම් දීමනාව අවස්ථා දෙකේම ගෙවා තිබීමෙන් රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු සඳහා රු.1,415,695 ක්ද, කුණ්ඩසාලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් පස් දෙනෙකු සඳහා රු.1,935,900 ක්ද, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයකු සඳහා රු.465,300 ක්ද, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් නව දෙනෙකු සඳහාද ජීවන වියදම් දීමනාව රු.3,816,895 ක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය කෙරේ. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2014 අනුව රු.7,800 සීමාව ඉක්මවා යාමක් සිදු වී නොමැති නිසා වැඩිපුර ගෙවීමක් සිදු වී නොමැත. | එකම කරුණක් මූලික කරගෙන පැන නැගුණු විශ්‍රාම වැටුප හා යැපීම් දීමනාවට තවත් දීමනාවක් ලෙස ජීවන වියදම් දීමනාව අවස්ථා දෙකේම ගෙවීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතුය. |
| (ග) | කුලියාපිටිය(නැගෙනහිර), රිදීගම, ගම්පහ, කුණ්ඩසාලේ, කැලණිය, බියගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයා මිය යෑම, ලියාපදිංචි මරණ සහතිකය ලබා නොගැනීම, විශ්‍රාම වැටුප් සංශෝධනයේදී සිදු වී ඇති වැරදි, මියගිය බව දැනුම්දීම ප්‍රමාද වීම, විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී සිදු වූ දෝෂ, සිවිල් විශ්‍රාම වැටුපක් ලබමින් සිටියදී ආබාධිත | පරීක්ෂා කර ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කරමි. | අදාල කරුණු නිවැරදිව සනාථ කර ගැනීම/ හඳුනා ගැනීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විශ්‍රාම වැටුපක් ලබා ගැනීම,පරිගණක පද්ධතිය යාවත් කාලීන නොකිරීම යනාදී හේතූන් මත විශ්‍රාමිකයින් 50 දෙනෙකු සඳහා රු.10,511,788 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | | |
| (ජ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් මියයාමෙන් පසුවද ඔවුන්ගේ ගිණුම්වලට බැර වූ මුදල් ආපසු අයකර ගැනීමේදී රු.172,279 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කරමි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ට) | විශ්‍රාමිකයකුගේ පාරිතෝෂික මුදල ඉක්මවා රජයට තවදුරටත් අයවිය යුතු ශේෂ ඇති විට එම මුදල් මාසික විශ්‍රාම වැටුපෙන් පද්ධතිය හරහා අඩුකර අදාල ආයතනය වෙත ගෙවීම් කර තිබූ අවස්ථා 05 ක් 2021 සැප්තැම්බර් මස ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර මෙවැනි අවස්ථාවල දී විශ්‍රාමිකයා, විශ්‍රාම වැටුප ගෙවීමට පෙර හදිසියේ මියගියහොත් එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් අවදානමක් පවතින අතර ඒ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කිරීම සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි. | පාරිතෝෂිකය ඉක්මවා යම් මුදලක් පවතී නම් එය මාසික හිඟ විශ්‍රාම වැටුපෙන් අය කොට අදාළ ආයතනය වෙත ලබා දෙනු ඇත. කෙසේ නමුත් විශ්‍රාම වැටුප ආරම්භ වීමට ප්‍රථම විශ්‍රාමිකයා මිය යාම තුළ රජයට අයවිය යුතු මුදලේ අවදානම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නොව විශ්‍රාම ගන්වන ආයතනය නිලධාරියා විශ්‍රාම ගැන්වීමට පෙර අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල ආයතන දැනුවත් කිරීම සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඩ) | වත්තේගම නගර සභාවේ ආදායම් පරීක්ෂක ලෙස සේවය කළ නිලධාරියෙකු 2010 මැයි මස 23 වනදා මිය ගොස් තිබුණු අතර පළමු විවාහයේ නෛසයි නඩු තීන්දු ප්‍රකාශය නියත කර නොමැති බැවින් මරණ පාරිතෝෂික මුදලින් වත්තේගම නගර සභාවට අයකර ගත යුතු මුදල් අය කිරීමෙන් පසු ඉතිරි මුදල වන රු. 237,492 ක මුදල 2023 මාර්තු 02 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවා ඇතත් උරුමකරුවන්ට හිමි ගැන්වීමට කටයුතු කර නොතිබුණි. | උරුමකරුවන්ට හිමි ගැන්වීමට කටයුතු කරමි. විශ්‍රාම වැටුප් අංක 50-2010711 දරුවාගේ වයස සම්පූර්ණ වීම නිසා ඔහුගේ විශ්‍රාම වැටුප නතර කළද එම කොටස විශ්‍රාම වැටුප් අංක 50-2010712 දරුවාට ගෙවීමට නොහැකි වී ඇත්තේ අතපසුවීමකින් බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | මරණ පාරිතෝෂික මුදල කඩිනමින් උරුමකරුවන්ට හිමි ගැන්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තවද, පළමු විවාහයේ දරු දෙදෙනාට හිමි විශ්‍රාම වැටුප පිළිවෙලින් 50-2010711 හා 50- 2010712 යටතේ සියයට 50 බැගින් ලබා දී ඇති අතර වැඩිමහල් දරුවාට වයස සම්පූර්ණ වූ පසු ඔහුගේ කොටස ද සමඟ 2019 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 09 දක්වා වූ කොටස රු.500,400 ක මුදල බාල දරුවාට ලබාදීමකින් තොරව විශ්‍රාම වැටුප ගෙවා තිබුණි. | | |
| (ත) | විශ්‍රාම වැටුප් අංක 24-71678 දරන ආබාධිත විශ්‍රාමිකයා විසින් 1997 ජනවාරි 27 වන දින කරන ලද ඉල්ලීමකට අනුව 2000 ජනවාරි 08 දිනැති ප්‍රදාන පත්‍රය මඟින් 1990 පෙබරවාරි 01 දින සිට ඔහුට ආබාධිත විශ්‍රාම වැටුපක් ගෙවා තිබුණි.<br>• එසේ වුවද, ඔහු ගමනාගමන මණ්ඩලයේ කල්මුණේ ඩිපෝවෙහි ගබඩා භාරකරු වශයෙන් සේවය කරමින් සිටියදී 1990 ජූලි 23 දින ත්‍රස්ත ප්‍රහාරයකට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව ඇති බැවින් 1988 ජූලි 13 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88 ප්‍රකාරව ගමනාගමන මණ්ඩලයෙන් දීමනා ලැබුවේ නම් එම කාල පරිච්ඡේදයට එනම්,වයස අවුරුදු 32 සිට අවුරුදු 55 දක්වා කාල පරිච්ඡේදයට ආබාධිත විශ්‍රාම වැටුපද ලබා ගෙන තිබුණි.<br>• මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මු.රෙ. 104 පරීක්ෂණයක් කරන ලෙස දන්වා තිබුණද, 2022 අගෝස්තු 05 දින වන විටත් අවුරුදු 03 ක් ගතවී තිබුණද, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>• මේ අනුව 1990 පෙබරවාරි 01 සිට 2018 පෙබරවාරි 09 දක්වා ආබාධිත විශ්‍රාම වැටුප හා දීමනා රු.2,877,159 ක් අයථා ලෙස ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය. | පරීක්ෂා කර ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කරමි. | අයථා ගෙවීම් සම්බන්ධයෙන් කඩිනමින් පියවර ගත යුතුය. |

(ද) දත්ත පද්ධතියේ පැවති දුර්වලතා සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශ්‍රාම වැටුප් අංක 21-400006 දරන විශ්‍රාමිකාවගේ විශ්‍රාම වැටුප් ගෙවීම් පරීක්ෂාවේ දී වැඩිපුර ගෙවා ඇති මුදල රු.424,925 ක් ලෙස දක්වා තිබුණ ද ඇයගේ විශ්‍රාම වැටුප 2021 මාර්තු 01 ආරම්භ වීම හේතුවෙන් ඇයට ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව රු.52,875 ක් හා රු.17,625 ක් ගැලපීමෙන් තොරව දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණි. වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් ආපසු අයකර ගැනීම් මාසික වාර්තාවට අනුව 2022 ඔක්තෝබර් මාසයේ දී වැඩිපුර ගෙවීම් අයකරගැනීම වාර්තා කර තිබුණද 2022 නොවැම්බර් මාසයේ දී මෙම අයවීම් සම්බන්ධ තොරතුරු දත්ත පද්ධතියෙන් ඉවත් වී තිබුණි. | 2022 ඔක්තෝබර් මස දක්වා රු. 112,500 ක් අය වී ඇත. 2022 නොවැම්බර් මස හිඟ මුදලක් ගෙවීමේදී රු.17,625 ක් අය කර ඇත. එම විශ්‍රාමිකාව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාම හේතුවෙන් ජීවන වියදම් දීමනාව එකතු නොවීම නිසා ගෙවිය යුතු රු.52,875 ක හිඟ මුදලද ඉහත වැඩිපුර ගෙවීමෙන් අඩු කර ඇත. ඒ අනුව තවදුරටත් අය කල යුතු මුදල රු. 241,925 කි. එම රු. 241,925 ක මුදල රු.6,000 මාසික වාරික අය කිරීම සඳහා 2023 පෙබරවාරි මස සිට විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත. ඒ අනුව 2023.05.10 දින වන විට රු. 24,000 ක් අය වී ඇත. තවදුරටත් අයවීමට ඇති මුදල රු. 217,925 කි. | ගෙවීම් හා ලැබීම් සම්බන්ධ තොරතුරු නිවැරදිව දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය.දත්ත පද්ධතිය තුළින් අඛණ්ඩව අය කිරීම් සිදු කළ යුතුය. |
| (ii) | 2020 හා 2021 වර්ෂවල මිය ගිය විශ්‍රාම වැටුප් අංක 21-40921 විශ්‍රාමිකයා හා 1-1225845/21-2011271 දරන විශ්‍රාමිකයා වෙත ඔවුන් මියගිය දින සිට 2022 අගෝස්තු 16 විගණිත දිනය දක්වා රු.3,434,597ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව දත්ත පද්ධතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වාර්තාවේ සඳහන් විශ්‍රාමිකයන් දෙදෙනා හඳුනා ගත නොහැක**.** | දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (iii) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 08 ක දත්ත පද්ධතිය තුළ ඇතුළත් විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් වූ විශ්‍රාමිකයාගේ උපන් දිනය ඇතුළත් කර නොතිබූ අවස්ථා 12 ක් ද ජීවිත සහතික ලබා නොදුන් බවට දත්ත පද්ධතිය තුළ සඳහන් වුවද විශ්‍රාම වැටුප් සක්‍රීය තත්ත්වයේ පැවති අවස්ථා 207 ක් ද ජාතික හැඳුනුම්පත් | විශ්‍රාමිකයාගේ උපන්දිනය, උප්පැන්න සහතික පරික්ෂා කර ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. ජීවිත සහතික ලබා නොදුන් නමුත් සක්‍රීය තත්වයේ පවතින විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් වර්ෂය අතරමැදදී ගෙවීම් ආරම්භ කළ විශ්‍රාම වැටුප් හැර | දත්ත පද්ධතිය නිවැරදිව යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| අංකය ඇතුළත් කර නොතිබූ අවස්ථා 21 ක් ද විශ්‍රාමිකයා මියගිය දිනය ඇතුළත් කර නොතිබූ අවස්ථා 02 ක් ද ජීවිත සහතික ලබා දී තිබියදී දත්ත පද්ධතිය තුළ ජීවිත සහතික ලබා නොදුන් බව සඳහන් වූ අවස්ථා 24 ක් ද ජාතික හැඳුනුම්පත් අංක හා උපන් දින නොගැලපුන අවස්ථා 07 ක් ද නිරීක්ෂණය විය. | පදිංචිය තහවුරු නොවූ විශ්‍රාමිකයන්ගේ වැටුප 2022 සැප්තැම්බර් මස සිට නතර කර ඇති බව දන්වා ඇත.<br>ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර නොතිබූ විශ්‍රාමිකයින්ගේ ජාතික හැඳුනුම්පත සකස් කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත අයදුම් කර ඇත.<br>ජාතික හැඳුනුම්පත් අංක හා උපන්දිනය නොගැලපුන අවස්ථා සහිත විශ්‍රාමිකයන් 03 කගේ විශ්‍රාම වැටුප අක්‍රීය කර ඇති අතර 02 කගේ වැටුප් නවතා ඇත. අනෙකුත් විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් පිළිතුරු සපයා නැත. | |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති තිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොමැත. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි. | මෙම අරමුණ ළඟා කර ගැනීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් සිදු කළ නොහැකි වුවද විශ්‍රාම යාමෙන් පසු ලබාදිය හැකි ප්‍රතිලාභ පිළිබඳව, සමාජයේ සියළු ස්ථර ආවරණය වන පරිදි පුළුල් විශ්‍රාම වැටුප් ආවරණ ක්‍රමයක් සැකසීමට අදාල මූලික සංකල්පය සහ යෝජනා 2020 වර්ෂයේදී “සැමට විශ්‍රාම” යෝජනාවලිය මගින් ඉදිරිපත් කර ඇත. | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |